BOI
SRI LANKA

# වාර්ෂික වාර්තාව 2021

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

BOI
SRI LANKA

# වාර්ෂික වාර්තාව 2021

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

# පටුන


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය | 5 |
| 2021 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳව | 7 |
| දැක්ම හා මෙහෙවර | 10 |
| වටිනාකම් | 11 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පැතිකඩ | 12 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සුවිශේෂී සිදුවීම් | 13 |
| 2021 වසරේ ගෝලීය ආයෝජන ප්‍රවණතාව | 14 |
| 2021 වසරේ විශේෂ අවස්ථා | 17 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පිළිබඳ සංක්ෂිප්ත සටහනක් | 18 |
| 2021 වසරේ ශ්‍රී ලංකාවේ ආයෝජන කාර්ය සාධනය | 20 |
| මෑතකාලීන ආරම්භයන් | 23 |
| අපගේ කාර්ය මණ්ඩලය | 27 |
| ආයතනික සමාජ වගකීම | 30 |
| 2021 වසරේ මූල්‍ය සමාලෝචනය | 33 |
| 2021 වසරේ විගණකාධිපතිවරයාගේ වාර්තාව | 75 |
| 2021 වසරේ විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පිළිතුරු | 91 |
| විගණන කමිටු වාර්තාව | 109 |
| 2021.12.31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් | 111 |
| ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය | 112 |

# අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය




2021 වසරද කෝවිඩ්-19 වසංගතය මගින් ඇතිවූ දැඩි අනපේක්ෂිත සමාජ-ආර්ථික අභියෝගයන්ගේ බලපෑම් මධ්‍යයේ ගෙවී ගිය අතර මෙමගින් ඍජු විදේශ ආයෝජන ගලනයන් හා රටේ ආර්ථික වර්ධනය කෙරෙහි අඛණ්ඩව බලපෑම් ඇතිකළ බැවින් ජාතික ආර්ථිකයේ ස්ථායිතාව හා වර්ධනය කෙරෙහි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දායකත්වය පෙරටත් වඩා ප්‍රමුඛ ලෙස වැදගත්වී ඇත. සංචාරක කර්මාන්තයේ බිඳවැටීම හා විදේශීය ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණයන් අඩුවීම හේතුවෙන් රටේ විදේශ ඉපයීම් කෙරෙහි දැඩි බලපෑම් ඇතිවී ඇති පසුබිමක ආසන්න වශයෙන් ජාතික අපනයනයෙන් 64%කට දායක වන ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් සුරක්ෂිත කිරීම හා වැඩිදියුණු කිරීම බෙහෙවින් වැදගත් වේ. අතරමැදි කොවිඩ්-19 ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම හරහා සේවකයින් ආරක්ෂා කිරීම ඇතුළු පූර්ව පහසුකම් සැලසීම මෙන්ම විවිධ ආකාරයෙන් ව්‍යවසායයන්ගේ සුභසිද්ධිය සඳහා කටයුතු කිරීම මගින් ආයෝජන මණ්ඩලයට සිය මෙහෙයුම් බිඳවැටීමකින් තොරව පවත්වා ගැනීමට හැකිවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස අති ප්‍රභල සාර්ව ආර්ථික අභියෝග හමුවේ වුවද, 2021 වසරේදී ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අපනයන 2020 වසරට සාපේක්ෂව 23%කින් වර්ධනය වූවා පමණක් නොව 2019 වසරේ වසංගතයට පෙර පැවති මට්ටමට වඩා 2%කින් වර්ධනය විය. ඒ අතරම, ආයෝජන මණ්ඩලය 2021 වසරේදී රටේ කාර්මික අපනයනයෙන් 83%කට වැඩි ප්‍රමාණයක් සඳහා දායක විය.

තවද, 2021 වසරේදී ඉලක්කගත උපායමාර්ග ක්‍රියාත්මක කිරීම හරහා ඍජු විදේශ ආයෝජන ගම්‍යතාව නැවත ලඟාකර ගන්නා අතරම 2020 වසර ආර්ථිකය පිරිහීමට හේතුවූ බලපෑම් වලින් මිදීම කෙරෙහි දැඩි අවධානයක් යොමුකල වසරක් විය. 2021 වසරේදී ද ආයෝජන මණ්ඩලය 2020 වසරේදී ආරම්භ කරන ලද අන්තර්වාර ආයතනික උපායමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, රට තුලට ඉලක්කගත විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා අවශ්‍ය මූලික ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කෙරිණ. ඒ අනුව, 2020 වසරේ ඍජු විදේශ ආයෝජනය වූ ඇ.ඩො. මිලියන 687 සාපේක්ෂව 2021 වසරේදී ඇ.ඩො. මිලියන 780 ඍජු විදේශ ආයෝජන ගලනයක් සක්ෂාත්කර ගැනීමට ආයෝජන මණ්ඩලයට හැකිවිය. ව්‍යාපෘති පුළුල් කිරිම් ඇතුලුව සමස්ත ආයෝජන වටිනාකම ඇ.ඩො. බිලියන 2.57 වන ආයෝජන ව්‍යාපෘති 126 (2020 වසරේදි 144 වූ) අනුමත කිරීමට අපට හැකිවිය. මෙම අනුමැතීන් සමග ආයෝජන මණ්ඩලය, 2021 වසරේදී ඇ.ඩො. මිලියන 1,741වන (ජාතික වත්කම් අලෙවියෙන් ලද මුදල් හැර) මෙතෙක් වාර්තාවූ වැඩිම ඍජු විදේශ ආයෝජන අනුමත කිරීම් වාර්තා කරනු ලැබීය. ඉදිරි වසර කීහිපය තුළ සාර්ව ආර්ථික අභියෝග ලිහිල් වනු ඇත යන විශ්වාසයෙන් වෙළඳ ශේෂය පියවීම සඳහා මෙම අනුමත ව්‍යාපෘති මගින් විශාල ඍජු විදේශ ආයෝජන ගලනයක් ජාතික ආර්ථිකයට ලැබෙනු ඇති බව අපේක්ෂා කළ හැක.

2021 වසර තුළ ආයෝජන මණ්ඩලය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරබොක්ක හා මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් ප්‍රදේශයන්හි පිළිවෙලින් ඖෂධ හා රෙදිපිළි නිෂ්පාදනය සඳහාම වෙන්වූ කාර්මික කලාප දෙකක් ස්ථාපනය කරනු ලැබීය. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති ලෙස හඳුනාගනු ලදුව ස්ථානය පදනම්ව ආකර්ෂණීය හා අනන්‍ය බදු දිරිගැන්වීම් හා සහන සළසමින් ජාතික වැදගත්කමක් සහිත විශේෂ අංශයන්හි දේශීය හා විදේශීය ආයෝජකයින්ට මෙම කලාප දෙකෙහි කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ඉඩ සැලසේ.

ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන හා ප්‍රාග්ධන වෙළඳපොළ ආයෝජන ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි සහයෝගීතාවය ඇතිව ශ්‍රී ලංකාවේ ප්‍රථම ආයෝජන සංසදය මාර්ගගතව පැවැත්වීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පසුගිය වසරේදී සිදුකරනු ලැබූ එක් ප්‍රධාන ආයෝජන ප්‍රවර්ධන ආරම්භයක් වේ. දේශීය මෙන්ම විදේශීය රටවල් 85ක 5,000කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වය ඇතිව පැවති මෙම සංසදය සඳහා රජයේ හා පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන්, ජාත්‍යන්තර විශේෂඥයින් මෙන්ම උපදේශක සමාගම් විසින් වේදිකාවක් සපයනු ලැබූ අතර එමගින් ඔවුන් අතර අදහස්, ප්‍රතිපත්ති සහ දැනුම හුවමාරු කරගැනීමට හා ආයෝජකයින් හා බලධාරීන් අතර සම්බන්ධතා ඇතිකර ගැනීම සඳහා පහසුකම් සලසනු ලැබීය. ඒ අතරම ආයෝජකයින් සඳහා පහසුකම් සැලසීමේදී ආයෝජන මණ්ඩලයට බාධා ඇතිකරන ප්‍රධාන ප්‍රතිපත්තිමය අවහිරතා සමහරක් ඉවත් කිරීම සඳහා ප්‍රගතිගාමී පියවර ගනු ලැබීය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට බලතල ලබාගැනීම, ක්‍රමවත් හා ස්ථාවර සහන, හා ප්‍රවාසිකයින් සඳහා වන වීසා ප්‍රතිපත්තිය ප්‍රතිසංස්කරණය කිරීම ඉන් කීපයකි.

මෙහෙයුම් ක්‍රමවත් කිරීමේ කාර්යයයේ කොටසක් ලෙස විවිධ ඩිජිටල්කරණ වැඩසටහන් දියත් කරනු ලැබූ අතර ඉන් බොහොමයක් මගින් ආයෝජන අනුමත කිරීම සහ රේගු නිෂ්කාශනය හා අදාල ක්‍රියාවලි සඳහා පහසුකම් සලසමින් හා එම ක්‍රියාවලි වේගවත් කරමින් සාර්ථක ලෙස ක්‍රියාත්මකවේ. මෙම සෑම ආරම්භයක්ම අදාල වගකිවයුතු කාර්ය මණ්ඩලයේ සහයෝගීතාවය ඇතිව ආයතනික දක්ෂතා මගින් සැලසුම්කර, වැඩිදියුණුකර ක්‍රියාත්මක කරනු ලැබූ බව සඳහන් කළ යුතුව ඇත. එකී ආරම්භයන් නිසා ආයෝජන මණ්ඩලයට මෙහෙයුම් පහසු කිරීම, විනිවිදභාවය, වගවීම මෙන්ම කෙටි කාලයකින් හා අඩු පිරිවැයකින් යුතුව ව්‍යාපාර කටයුතු පහසු කිරීම කැපීපෙනෙන ලෙස වැඩිදියුණු කිරීමට හැකිවී තිබේ.

අපගේ කුසලතා සපිරි අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම, ආයෝජන මණ්ඩල කණ්ඩායමේ හා අප විශ්වාසනීය ආයෝජකයින්ගේ මෙන්ම රේඛීය නියෝජිතායතන වල කැපවීම හා සහය නොවන්නට මේ සියලු කාර්යයන් ඉටු කිරීමට නොහැකි වනු ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මෙන්ම රටේ සංවර්ධනය සඳහා ලබාදෙන දායකත්වය වෙනුවෙන් ඔවුන් සියලු දෙනාට මාගේ හෘදයාංගම කෘතඥතාව පිරිනැමීමට මා මෙය අවස්ථාවක් කරගනිමි.

**පසන් වනිගසේකර**

# 2021 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳව



**සංජය මොහොට්ටාල මහතා**
**සභාපති**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා වන සංජය මොහොට්ටාල මහතා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ, අපනයන සංවර්ධන මණ්ඩලයේ සහ සහස්‍යා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි. ඔහු ආර්ථික පුනර්ජීවනය සහ දිළිඳුකම තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකායේද සාමාජිකයෙකි.

ආයෝජන මණ්ඩලයට එක්වීමට පෙර Boston Consulting Group හි කළමනාකාර අධ්‍යක්ෂ හා හවුල්කරුවකු වූ සංජය මොහොට්ටාල මහතාට ඉන්දීය-ශාන්තිකර කලාපය, යුරෝපීය සංගමය හා එක්සත් ජනපදය සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇත. ඒකාබද්ධ කිරීමේ හා අත්පත් කරගැනීමේ (M&A) ආයෝජන, ආයතනික සංවර්ධන උපායමාර්ග, ප්‍රතිසංවිධානය, වෙළඳපළ සොයා ගැනීම, ඩිජිටල් හවුල්කාරිත්වය හා මහා පරිමාණ ප්‍රතිව්‍යුහගත කිරීම් පිළිබඳ මනා පළපුරුද්ද සමගින් ඔහු ප්‍රධාන ආයෝජකයින්ට හා පෞද්ගලික කොටස් සේවාලාභීන්ට (PIPE), ස්වෛරීත්ව ධන අරමුදල (SWF), ගෝලීය බහුජාතික සහයෝගීතාවයන් (Global MNCs), කලාපීය හා දේශීය සමාගම් සඳහා උපදෙස් ලබා දෙයි. මීට පෙර මොහොට්ටාල මහතා යුනිලීවර් ශ්‍රී ලංකා සමාගමේ සන්නාම කළමනාකරු සහ මිලේනියම් තොරතුරු තාක්ෂණ (IT) සමාගමේ ඔරකල් නිෂ්පාදන විශේෂඥවරයා ලෙස කටයුතු කරනු ලැබීය.

මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා දුරකථන සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (විශිෂ්ඨ සාමාර්ථයක් සහිතව) ලබා ඇති මොහොට්ටාල මහතා UCLA ආයතනයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (MBA, a Fulbright Scholar) ලබා ඇත. කළමනාකරණ ගණකාධිකාරිවරයෙකුද (CIMA - UK) වන ඔහු අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයෙන් (CIM – UK) අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත.



**ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා, ජනාධිපති නීතිඥ**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා සමාගම් නීතිය, බුද්ධිමය දේපළ නීතිය, වාණිජ නීතිය, සුරැකුම්පත් නීතිය, ජාත්‍යන්තර වෙළඳ නීතිය හා වාණිජ විනිශ්චය යන ක්ෂේත්‍රයන්හි වසර (තිස් තුනක) පළපුරුද්දක් සහිත ජනාධිපති නීතිඥයෙකි. වසර දහසයක් (16) ජනාධිපති නීතිඥයෙකු ලෙස කටයුතු කරනු ලැබූ ඔහු ශ්‍රී ලංකාවේ වාණිජ මහාධිකරණයේ හා උපරිමාධිකරණයේ සුවිශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. ඔහු ඔස්ට්‍රේලියාවේ කැන්බරා විශ්වවිද්‍යාලයෙන් සංස්ථාපිත නීතිය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇත.

ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC), පැරීසියේ ජාත්‍යන්තර බේරුම් කිරීමේ උසාවියේ සාමාජිකයෙකු වන ආචාර්ය කබ්රාල් මහතා ඒකාබද්ධ ගැටුම් කළමනාකරණ සම්මේලනයේ (FICM) සහ ජාත්‍යන්තර වාණිජ ආරවුල් විනිශ්චය සභාවේ (ICDT) නියෝජිත සාමාජිකයෙකු ද වේ. එසේම ඔහු එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන්ගේ හා පරිපාලකයින්ගේ ආයතනයේද සාමාජිකත්වය දරයි.



**සංජේ කුලතුංග මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

සංජේ කුලතුංග මහතා චිකාගෝ විශ්වවිද්‍යාලයේ Booth School of Business වෙතින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගෙන ඇති අතර වරලත් මූල්‍යමය විශ්ලේෂක සංගමය (CFA) මගින් මූල්‍ය හා ආයෝජන වෘත්තිකයින් සඳහා පිරිනමන වෘත්තීය පිළිගැනීම ද (CFA Charterholder) ලබා ඇත.

Jardine Fleming Hong Kong සමාගමෙහි කලාපීය විශ්ලේෂකයෙකු ලෙස කටයුතු කරනු ලැබූ කුලතුංග මහතා දැනුම කාර්යාවලි බාහිරින් සපයා ගැනීමේ සමාගමක් වන Amba Research Lanka සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරයාවේ. නිෂ්පාදන, විවේක හා මූල්‍ය ක්ෂේත්‍රයන් ඇතුළු තෝරාගත් කර්මාන්තයන්හි ප්‍රධාන විධායක නිලධාරි, විධායක අධ්‍යක්ෂ හා ප්‍රාරම්භක යන තනතුරු හොබවා ඇත. ඔහු ශ්‍රී ලංකාවේ වරලත් මූල්‍ය විශ්ලේෂක සංගමයේ (CFA) සභාපතිවරයා ලෙසද කටයුතු කර ඇති අතර ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු ලෙස මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය අංශයේ ස්ථායිතාවය පිළිබඳ උපදේශණ කමිටුවේද කටයුතු කර ඇත.



**ආචාර්ය හර්ෂ සුභසිංහ මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ආචාර්ය හර්ෂ සුභසිංහ මහතා ශ්‍රී ලංකාව, එක්සත් රාජධානිය හා ඇ.එ.ජ මූලික කරගත් කෝඩ්ජෙන් සමාගම් සමූහයේ ප්‍රාරම්භක, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියා ද වේ. මෙම සමාගම සංචාර, අධ්‍යාපන, මෝටර් රථ, ප්‍රවාහන, කෘෂිකාර්මාන්තය, බලශක්තිය හා සෞඛ්‍ය සේවා යන බහුවිධ කර්මාන්ත සඳහා පූර්ණ ප්‍රවේශයක් සහිත, ඉහළ කාර්යසාධනයකින් යුත් නවෝත්පාදන විසඳුම් ලබාදීම සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. TravelBox Vega, chargeNET, AiGROW, Cloud Smart School සන්නාමයන් සමගින් කෝඩ්ජෙන් සමාගම ශ්‍රී ලංකාවේ කෘතිම බුද්ධිය සම්බන්ධ පෞද්ගලික අංශයේ විශාලම ආයෝජනයන්ගෙන් එකක් වේ. ආචාර්ය හර්ෂ සුභසිංහ කෝඩ්ජෙන් සමාගමේ අති නවීන නිෂ්පාදන සැලසුම් හා විසඳුම් සමගින් බොහෝ වාරයක් සාඩම්බරයෙන් ලෝකයේ වෙනත් රටවල් අතරට ශ්‍රී ලංකාව ගෙන එනු ලැබ තිබේ.

ශ්‍රී ලංකාවේ නවෝත්පාදන සංස්කෘතිය දිරිමත් කිරීම සඳහා ආචාර්ය සුභසිංහ මහතා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරයි. ඉහළ බුද්ධිමය දේපළ වටිනාකමක් සහිත සැබෑ ලෝකයේ ව්‍යාපෘති සඳහා පහසුකම් සලසන අතරම අනාගත පරම්පරාව කර්මාන්ත සඳහා සූදානම් කරන QBITS Labs වැනි රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් සඳහා ප්‍රධාන අනුග්‍රාහකයෙකු ලෙස කටයුතු කරයි. මොරටුව විශ්වවිද්‍යාලයේ QBITS Labs මගින් එහි සිසුන්ට වසර 3ක වැඩකිරීමේ ආචාර්ය උපාධියක් ලබාදේ.

ට්‍රේස් එක්ස්පර්ට් සිටි සමාගමේ ප්‍රධාන නිර්මාතෘවරයෙකු වන ආචාර්ය හර්ෂ සුභසිංහ එහි උප සභාපතිවරයාද වේ. මෙම සමාගම, පරිසර හිතකාමී පරිසරයක් සහ ශ්‍රී ලංකාව තුළ අතිවිශේෂ නිෂ්පාදන නිපදවීම සඳහා නවෝත්පාදන අංශයේ අතිදක්ෂ කාර්ය බලකායකින් සමන්විත ලොව ඉහළ තත්වයේ කාර්ය පරිශ්‍ර ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය සමග දිගුකාලීන ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය.

එක්සත් රාජධානියෙන් විදුලි, ඉලෙක්ට්‍රොනික සහ පරිගණක ඉංජිනේරු උපාධිය ලබා ඇති ආචාර්ය හර්ෂ සුභසිංහ මහතාගේ ශාස්ත්‍රීය අධ්‍යයනයන්ට තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය මෙන්ම කෘත්‍රිම බුද්ධිය හා මෘදුකාංග පිළිබඳ ආචාර්ය උපාධි පර්යේෂණයක් ඇතුලත්වේ.



**ජයමින් පැල්පොල මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ජයමින් පැල්පොල මහතාට Goldman Sachs (UK) හා Nomura USA ඇතුළුව ජාත්‍යන්තර ආයෝජන බැංකුකරණය හා වත්කම් කළමනාකරණයේ වසර 10කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහු වෝල් ස්ට්‍රීට්හි සිය නිර්මාණාත්මක හා වඩාත්ම ලාභදායි ආයෝජන උපාය මාර්ග සඳහා පිළිගැනීමක් ඇති සමාගමක් වන Goldman Sach හි ප්‍රධාන උපාය මාර්ගික කණ්ඩායමේ සේවයෙහි නියුතුව ඇති එකම ශ්‍රී ලාංකිකයා වේ. පැල්පොල මහතා සිය වෘත්තියේදී විවිධ අංශයන් හා විවිධ රටවල ඇ.ඩො. බිලියන 20ට වැඩි වටිනාකමකින් යුත් ජාත්‍යන්තර ආයෝජන ව්‍යුහගත කිරීම හා කළමනාකරණය කිරීම සිදුකර ඇත.

ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකු වශයෙන් පැල්පොල මහතා බැංකු අංශයේ ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳව එක්සත් ජනපදයේ බැංකු හා ජාත්‍යන්තර මහ බැංකු සඳහා උපදෙස් ලබාදී ඇත. විශේෂයෙන්ම ඔහු නියාමකයින්ට මෙන්ම ඇමරිකානු බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට, DBS, Wells Fargo yd Deutsche Bank සඳහා ප්‍රාග්ධන ප්‍රමාණවත් බව පිළිබඳ තීරණ, ප්‍රාග්ධනීකරණය සහ බැංකුකරණයේදී ඩිජිටල් නවෝත්පාදන යෙදවීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙනු ලැබීය.

මූල්‍ය අංශයේ සිය පළපුරුද්ද ගොඩනගාගත් පැල්පොල මහතා ආයෝජකයෙකු හා ව්‍යවසායකයෙකු ලෙස Fintech සමාගමට එක්විය. සම්ප්‍රදායික නොවන වත්කම් මිල කිරීම සඳහා වෙළඳ නාමයක් යටතේ ලියාපදිංචි කරන ලද ආකෘතියක් වැඩිදියුණු කිරීම සහ එය Wall Street බැංකුවට විකිණීම මගින් ඔහු සිය ව්‍යවසායකත්ව ගමන්මග ඇරඹීය.

ජයමින් පැල්පොල මහතා, මූල්‍ය අංශය සඳහා තාක්ෂණය හා දත්ත විද්‍යාව අදාලකර ගැනීමේ කාර්යය වෙනුවෙන් ආසියාවේ හොඳම Fintech ආරම්භක සමාගම් වලින් එකක් ලෙස හඳුනාගනු ලැබූ Moneyworkz Technologies සමාගමේ ආරම්භක සභාපතිවරයා ද වේ.

වර්තමානයේ ඔහු ජයරු ට්‍රේඩ් පාර්ට්නර්ස් සමාගමේ සභාපතිවරයා හා සිලෝන් එකෝ ස්පයිසස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි. සිලෝන් එකෝ ස්පයිසස් සමාගම ජාත්‍යන්තර වෙළඳපල 10කට වැඩි සංඛ්‍යාවක් සඳහා කල්තබා ගත හැකි කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩ අපනයනය කරන ප්‍රධාන ශ්‍රී ලාංකීය අපනයන සමාගමකි.

හාවඩ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇති පැල්පොල මහතා CFA Institute (USA) සහ CIMA (UK) වෙතින් මූල්‍ය හා ආයෝජන වෘත්තිකයින් සඳහා පිරිනමන වෘත්තීය පිළිගැනීමද ලබාගෙන ඇත. වයස අවුරුදු 20දී ලොව ලාබාලම CIMA කළමනාකරණ ගණකාධිකාරිවරයා වූ ඔහු එවර ලාබාලම CIMA ත්‍යාගලාභියාද විය. CIM (UK) වෙතින් ඔහු සිය අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත.

අපගේ

# දැක්ම

"ආසියාවේ තිරසාර ආයෝජන සඳහා වඩාත්ම ආකර්ෂණීය ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත්කිරීම"

අපගේ

# මෙහෙවර

"ශ්‍රී ලංකාවට ගුණාත්මක ආයෝජන ආකර්ෂණය කරගැනීමේ හා රඳවා ගැනීමේ විභවතාවය ඉටුකිරීම සඳහා, වැඩිදියුණු කළ අපනයන පදනමක් ලබාදීමට මූලික වෙමින් සහ වඩා හොඳ රැකියා අවස්ථා ඇති කිරීමටත් නව තාක්ෂණය හා නවෝත්පාදන තුලින් දැනුම හා නිපුණතා වැඩිදියුණු කිරීමටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ධනාත්මකව හා වේගවත් ලෙස කටයුතු කරයි"

# වටිනාකම්

## ◈ කාර්ය සාධනය සහ ඉලක්ක ළඟාකර ගැනීමේ අභිලාෂය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, තාත්වික ආයෝජන සහ රැකියා අවස්ථා බිහි කිරීමේ ඉලක්ක සමගින් සිය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනිමට ක්‍රියාකරනු ඇත.

## ◈ රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සම්බන්ධතාවය ගොඩනැගීම

රටේ ආර්ථික සෞභාග්‍යය සඳහා ඉවහල්වන ආයෝජන සඳහා පහසුකම් සැලසීම, සුරක්ෂිතතාවය සහ වර්ධනය කිරීමේ අභිමානවත් කාර්යය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉටු කරනු ඇත. අපගේ මෙහෙවර ඉටුකිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම ආයතන සමග සහයෝගීතාවයෙන් හා හවුල්කාරීත්වයෙන් කටයුතු කරන අතර ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීමට ද දායක වන්නෙමු.

## ◈ වෘත්තීය දැනුම සහ අඛණ්ඩතාව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජකයින්ගේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට කැපවනු ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී වාණිජ හා නව්‍ය විසඳුම් ලබාදෙනු ලැබේ. අපි විසින් අඛණ්ඩව, විශ්වාසනීයත්වයෙන් මේ සඳහා හෘදයාංගමව කැප වී සිටින්නෙමු.

## ◈ උසස් පාරිභෝගික සේවාව

ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා තරඟ කිරීමේදී ක්‍රියාකාරී මෙන්ම සුවිශේෂී මට්ටමෙන් කටයුතු කිරීම.

## ◈ කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, සිය කාර්ය මණ්ඩලයේ දක්ෂතාවය, සහයෝගීතාවය, කැපවීම හා වගකීම අගය කරනු ඇත. කාර්ය මණ්ඩලයට සේවයේ නිරත වීම, අභිවෘද්ධිය සහ සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා වන සුවිශේෂී ස්ථානයක් බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පත්කිරීම කෙරෙහි අප නිරන්තර අවධානය යොමු කරන්නෙමු.

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පැතිකඩ

1978 දී සංස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජන ප්‍රවර්ධනය, විදේශ විනිමය ඉපයීම් වැඩිකිරීම හා විවිධාංගීකරණය කිරීම, ආයෝජන කලාප සංවර්ධනය හරහා රට තුළ කර්මාන්ත හා ව්‍යවසායයන් ස්ථාපනය කිරීම දිරිමත් කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම සහ ආර්ථිකයේ පදනම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම යන කාර්යයන් ඉටුකිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කිරීමේ විධිවිධාන සමගින් ව්‍යවස්ථාපිත ආයතනයකි.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සිදුකිරීමේ ප්‍රධාන ආයතනයක් ලෙස පිළිගත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ශිල්පීය හා අංශික රැකියා අවස්ථා බිහිකිරීම, අපනයන උත්පාදනය හා රට තුළට තාක්ෂණය හා නිපුණතා පැවරීම වැඩිදියුණු කිරීම මගින් සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගනිමින් තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා දායකවේ. 1978 වසරේදී ශ්‍රී ලංකාවේ ස්ථාපිත ප්‍රථම අපනයන සැකසුම් කලාපය (EPZ) වන කටුනායක අපනයන සැකසුම් කලාපයෙන් ආරම්භකර අනතුරුව දිවයින පුරා ස්ථාපිත අපනයන සැකසුම් කලාප 15 සඳහා කර්මාන්ත ස්ථාපනය කිරීමට අවශ්‍ය විදුලිය, ජලය, ප්‍රවාහන පහසුකම්, සන්නිවේදන හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් වැනි සියලු යටිතල පහසුකම් සපයනු ලැබේ.

## අරමුණ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අරමුණ වන්නේ ජාතික ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, විදේශ ආයෝජන සඳහා මග සැලසීම සහ ඵලදායී ආයෝජන වාතාවරණයක් ඇතිකිරීම මගින් රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම වේ. එමගින් අපනයන ආදායම් බිහිකරමින් සහ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ආයෝජන ගමනාන්තයක් බවට පත්කිරීමේ අභිප්‍රායෙන් තිරසාර විදේශ ආයෝජන ළඟාකර ගැනීම සඳහා මහත් පරිශ්‍රමයක් දරනු ලැබේ.

## පරමාර්ථ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූලික පරමාර්ථ තුළින් ආර්ථික සංවර්ධනය ඇතිකිරීම සහ වැඩිදියුණු කිරීම, ආර්ථිකයේ පදනම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම, සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම, විදේශ විනිමය ඉපයීමේ ප්‍රභව විවිධාංගිකරණය කිරීම හා අපනයන ආදායම ඉහළ නැංවීම, ශ්‍රී ලංකාව තුළ කර්මාන්ත හා ව්‍යවසායයන් ස්ථාපනය කිරීම හා සංවර්ධනය කිරීම, දිරිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

## කාර්යභාරය

- රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වමින් සෘජු විදේශ ආයෝජන මට්ටම ක්‍රමිකව ඉහළ නැංවීම සහ ජාතික වර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා දායකත්වයක් ලබාදෙමින් ආර්ථිකයේ ප්‍රමුඛතම අංශ සඳහා ආයෝජන ඉලක්ක කිරීම හා ආයෝජන ආකර්ෂණය කරගැනීම.
- ශ්‍රී ලංකාවේ ඉහළ අගයක් එක්කළ/උසස් තාක්ෂණික නිෂ්පාදන, ඉහළ අගයක් එක්කළ ඇඟළුම්, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා, සංචාරක කර්මාන්තය, ආහාර පිරිසැකසුම් කිරීම, සැපයුම් සේවා, අධ්‍යාපන හා මහා පරිමාණ යටිතල පහසුකම් හෝ වෙනත් තෝරාගත් අංශවල ව්‍යාපෘති සැලසුම් කිරීමේ අභිප්‍රායෙන් යුත් ආයෝජකයන් සමඟ සම්බන්ධ වීමේ පළමු ස්ථානය වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරයි. ආයෝජකයින්ට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තොරතුරු හා මාර්ගෝපදේශන ලබාදෙන අතර වෙනත් රේඛීය ආයතනවල අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවලදී එම ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු ද සිදුකරයි.
- ආයෝජන සහන අනුමත කිරීම හා අවසර ලබාදීම සහ අදාළ අංශවල ආයෝජන අයදුම්පත් ඇගයුම් කිරීම මෙන්ම මෙම ව්‍යාපෘතිවල විදේශික ශ්‍රමිකයන්ට වීසා නිකුත් කිරීම ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සිදු කරයි.
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය ආනයනය මෙන්ම නිමි භාණ්ඩ අපනයනය සඳහා ද ආනයන/අපනයන නිශ්කාෂණ ලබා ගැනීම සහ පහසුකම් සැලසීම මගින් ව්‍යාපෘති ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම සහ සාර්ථකව මෙහෙයුම් කිරීම දක්වා වන සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය පුරා ආයෝජකයන්ට සහාය ලබාදේ.
- අවම කාලයක් තුළ ආයෝජකයින්ට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පරිශ්‍ර සැපයීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් අවශ්‍ය යටිතල පහසුකම් සහිතව අපනයන සැකසුම් කලාප සංවර්ධනය කෙරේ.

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සුවිශේෂී සිදුවීම්

**1978** 1978 අංක 04 දරණ පාර්ලිමේන්තු පනත යටතේ මහ කොළඹ ආර්ථික කොමිසම (GCEC) ස්ථාපනය කිරීම.

ශ්‍රී ලංකාවේ ප්‍රථම හා මේ දක්වා පවත්වාගෙන යන විශාලම අපනයන සැකසුම් කලාපය වන කටුනායක අපනයන සැකසුම් කලාපය 1978 දී ස්ථාපනය කිරීම.

**1986** අපනයන සැකසුම් කලාපයන්හි ව්‍යවසායයන්ට සහයදීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම මගින් ඊකියා බැංකුව ඇතිකිරීම.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දෙවන අපනයන සැකසුම් කලාපය ලෙස 1986 දී බියගම අපනයන සැකසුම් කලාපය ස්ථාපනය කිරීම.

**1990** විදේශ ආයෝජන උපදේශන කමිටුව හා මහ කොළඹ ආර්ථික කොමිසම එකට එක්වූ අතර ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන අනුමත කිරීමේ පූර්ණ අධිකාරිය මහ කොළඹ ආර්ථික කොමිසමට හිමිවිය.

**1991** දකුණු පළාත සංවර්ධනය කිරීම සඳහා කොග්ගල අපනයන සැකසුම් කලාපය පිහිටුවීම.

**1992** 1992 අංක 49 දරන පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සංස්ථාපනය කරනු ලැබූ අතර එය මහ කොළඹ ආර්ථික කොමිසමේ (GCEC) අනුප්‍රාප්තිකයා වේ.

විරැකියාව අවම කිරීම සඳහා රජයේ කලාපීය සංවර්ධන වැඩසටහන යටතේ "ඇගළුම් කම්හල් 200 වැඩසටහන" හඳුන්වා දෙනු ලැබීය.

**1995** මහනුවර කාර්මික උද්‍යානය පිහිටුවීම.

**1998** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා ආයෝජන යටිතල පහසුකම් කාර්යාංශය (BII) ඒකාබද්ධ කරනු ලැබීය.

මීරිගම අපනයන සැකසුම් කලාපය හා මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය (EPP) පිහිටුවීම.

**1999** හොරණ අපනයන සැකසුම් කලාපය හා වතුපිටිවල අපනයන සැකසුම් කලාපය පිහිටුවීම.

**2000** පොල්ගහවෙල, මාවතගම හා මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාප පිහිටුවීම.

**2001** සීතාවක කාර්මික උද්‍යානය, සීතාවක අපනයන සැකසුම් කලාපය ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා ගැනීම.

**2006** කර්මාන්ත ග්‍රාමීය අංශය වෙත ගෙනයාමේ අරමුණ ඇතිව "ව්‍යවසායයන් 300 වැඩසටහන" ආරම්භ කරනු ලැබීය.

**2008** ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් 09ක් මිලදී ගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ස්ථිර ලෙස ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ස්ථාපනය කිරීම.

**2009** ISO 9001:2000 ලබාගත් ප්‍රථම රාජ්‍ය ආයතනය වුයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ යාපනය කාර්යාලය පිහිටුවනු ලැබීය.

**2011** ඇ.ඩො. බිලියන 1ක සෘජු විදේශ ආයෝජන ඉලක්කය ලඟාකරගනු ලැබීය.

**2013** 2013 දී "පොදු රාජ්‍ය මණ්ඩලයීය නායකයින්ගේ සමුළුවට" (CHOGM) සමගාමීව පැවති "පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදය" සංවිධානය කිරීමේ මූලිකත්වය ගනු ලැබූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි.

**2014** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් - "ආසියා ශාන්තිකර ව්‍යාපාරික සංසදය 2014" සඳහා අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබීය.

**2017** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 40 වන සංවත්සරය සැමරීම.

**2018** ඇ.ඩො. බිලියන 2.37ක ඉහලම සෘජු විදේශ ආයෝජනයක් ලගාකර ගනු ලැබීය.

**2019** බිංගිරිය අපනයන සැකසුම් කලාපය ස්ථාපනය කිරීම.

**2020** එරාවූර් හා ආරබොක්ක (හම්බන්තොට) නව අපනයන සැකසුම් කලාප 2 සංවර්ධනය කිරීම ආරම්භ කරනු ලැබීය.

**2021** රටවල් 85ක, 5,000 වැඩි දේශීය හා විදේශීය සහභාගීත්වයක් සහිතව ශ්‍රී ලංකාවේ ප්‍රථම ආයෝජන සංසදය මාර්ගගතව පවත්වන ලදී.

# 2021 වසරේ ගෝලීය ආයෝජන ප්‍රවණතාව

2020 වසරේදී වාර්තාවූ ඇ.ඩො. බිලියන 929 අපේක්ෂිත පරිදි, 2021 වසරේදී ඇස්තමේන්තුගත අගය වූ ඇ.ඩො. ට්‍රිලියන 1.65 ක අගය ලඟාකර ගනිමින් ගෝලීය සෘජු විදේශ ආයෝජන (FDI) යළිත් 77% කින් වර්ධනය විය. මෙම අගය වසංගතයට පෙර 2019 වසරේ අගය වූ ඇ.ඩො. ට්‍රිලියන 1.54 අගයද ඉක්මවා ඇත.

ගෝලීය සෘජු විදේශ ආයෝජන සමස්ත වැඩිවීමත් සමග ඉහළ යථා තත්වයට පත්වීමක් වාර්තාවූ අතර කලාපීය හා ආංශික වශයෙන් බෙදීම සංසන්දනය කළවිට යථා තත්වයට පත්වීමේ වර්ධනය කැපී පෙනෙන විෂමතාවක් පෙන්නුම් කෙරේ. ගෝලීය සෘජු විදේශ ආයෝජන ගලනයේ සමස්ත වැඩිවීමෙන් හතරෙන් තුනක් පමණ ආකර්ෂණය කිරීමට හා වාර්තා කිරීමට සංවර්ධිත රටවල් වලට හැකිවූ අතර සංවර්ධනය වන රටවල් හා විශේෂයෙන්ම අඩුවෙන්ම සංවර්ධිත රටවල ප්‍රමාණවත් තත්වයට පත්වීමේ වර්ධනයක් පමණක් දක්නට ලැබුණි.

2020 වසරේ සුවිශේෂි අඩු මට්ටම් හා සංසන්දනය කිරීමේදී සෘජු විදේශ ආයෝජනයේ තුන් ගුණයක වැඩිවීමක් පෙන්නුම් කරමින්, 2021 වසරේදී සංවර්ධිත රටවල් අතර ඇ.ඩො. බිලියන 777 වූ විශාලම වර්ධනය දක්නට ලැබුණි. මෙයින් යුරොපයට ගලා ඒම් 80%කට වැඩි ප්‍රමාණයක් වාහක ආර්ථිකයන්හි විශාල වෙනස්වීම් සිදු වූ අතර, ඇ.එ.ජනපදයේ දෙගුණයක් වූ සෘජු විදේශ ආයෝජන ගලනයට විදේශීය සමාගම් හා දේශීය සමාගම් අතර (Cross-Border Mergers and Acquisitions) ආයෝජන විශාල වශයෙන් හේතු විය.

**2019-2021 අතර කාලයේ සෘජු විදේශ ආයෝජන ගලනයන් (ඇ.ඩො. බිලියන)**




මූලාශ්‍රය : UNCTAD (ආයෝජන ප්‍රවණතා වාර්තාව, 2022 ජනවාරි)

නැගෙනහිර හා අග්නිදිග ආසියානු රටවල් කේන්ද්‍ර කරගත් සීඝ්‍ර වර්ධනය සමගින් සංවර්ධිත රටවල් කරා වන සෘජු විදේශ ආයෝජන ගලනයන් ආසන්න වශයෙන් ඇ.ඩො. බිලියන 870ක සමස්ත අගයක් ලඟාකර ගනිමින් 30% කින් වැඩිවිය. දකුණු අසියාවට සිදු වූ සෘජු විදේශ ආයෝජන ගලනයන් 2020 වසරේදි ඉහළ ගිය ද පෙර වසරට සපේක්ෂව 2021 වසරේ දී 24%ක පහත යාමත් සමඟ සෘජු විදේශ ආයෝජන ගලනයේ සෘණ වර්ධනයක් වාර්තා කළ ආසියාවේ එකම උප කාලාපය බවට පත් විය. ලතින් ඇමරිකානු හා කැරිබියන් කලාපයන්ට ද සිය සෘජු විදේශ ආයෝජන වසංගතයට පෙර තිබූ මට්ටමට ආසන්න අගයක පවත්වා ගැනීමට හැකිවිය.

දිගු කාලීන මූල්‍ය කොන්දේසි යථා තත්වයට පත්වීම උනන්දු කරවන පැකේජ හා ජාත්‍යන්තර ආයෝජන වැඩසටහන් මගින් බලගැන්වූ ජාත්‍යන්තර ව්‍යාපෘති මූල්‍ය ගනුදෙනු 53%කින් ඉහල ගිය බැවින් ඉහළ ආදායම් කලාප, ආසියාව, ලතින් ඇමරිකාව හා කැරිබියන්හි කැපී පෙනෙන ඉහළ යාමක් පෙන්නුම් කරමින් යටිතල පහසුකම් අංශයේ අගය 91%කින් ඉහළ යනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස යටිතල පහසුකම් සඳහා විශේෂයෙන්ම පුනර්ජනනීය බලශක්තිය හා කාර්මික දේපළ වෙළඳාම් උප අංශයන්හි ව්‍යාපෘති මූල්‍යනය් වසංගතයට පෙර පැවති මට්ටම් අභිබවා ගොස් ඇත.

අනෙක් අතට 7% අගයකින් පමණක් වැඩිවූ කර්මාන්තයන් හා ගෝලීය අගය දාමයන්හි නව සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ව්‍යාපෘති (Greenfield Investment Project) වාර්තා නොවූ තරම් විය. ගෝලීය අගය දාමයන් තුළ මූලික පිරිවැය අධික කර්මාන්තයන්හි ආරම්භ වූ නව ව්‍යාපෘති සංඛ්‍යාව තව දුරටත් අඩු විය. ඒ අනුව, සම්පූර්ණයෙන්ම යථා තත්වයට පත්වූ තොරතුරු හා සන්නිවේදන/ඩිජිටල් අංශ හැර සියලු කාර්මික අංශ හරහා නව සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ක්‍රියාකාරකම් සාමාන්‍යයෙන් වසංගතයට පෙර පැවති තත්වයට 30% කට අඩු අගයක අඛණ්ඩව පැවතිණ.

**නව සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ව්‍යාපෘති (Greenfield Investment Project) 2019-2021**




මූලාශ්‍රය : UNCTAD (ආයෝජන ප්‍රවණතා වාර්තාව, 2022 ජනවාරි)

**2019 - 2021 වසරවල ප්‍රකාශ කරන ලද නව සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ව්‍යාපෘති (Greenfield Investment Project), තෝරාගත් කර්මාන්තයන් වශයෙන් - වටිනාකම අනුව ප්‍රමුඛ කර්මාන්ත 05 (ඩොලර් බිලියන)**




මූලාශ්‍රය : UNCTAD (ආයෝජන ප්‍රවණතා වාර්තාව, 2022 ජනවාරි)

එක්සත් ජනපදය විශාලම සත්කාරක රාජ්‍යය ලෙස සිය ස්ථානය පවත්වා ගනිමින් 2021 වසරේදී විදේශීය සමාගම් හා දේශීය සමාගම් අතර (Cross-border M&As) ආයෝජන අගයන් තෙගුණ කර ගනිමින් සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. බිලියන 323ක් දක්වා 114%කින් වැඩිකර ගනු ලැබීය. චීනය ඇ.ඩො. බිලියන 279 දක්වා සෘජු විදේශ විනිමය ගලනයන් 20% වැඩිවීමක්ද, බ්‍රසීලය 2020 වසරේ වාර්තාවූ අඩු අගය, ඇ.ඩො. බිලියන 58 ලෙස දෙගුණයක් කරගත් අතර යුරෝපා සංගමය ද සෘජු විදේශ ආයෝජන ගලනයන්හි 8% වර්ධනයක් අත්පත් කරගනු ලැබීය. අනෙක් අතට, 2020දී අනුගමනය කළ අනුබද්ධ සමාගම් ගනුදෙනු නැවත සිදු නොවූ බැවින් ඉන්දියාව කරා විදේශ ආයෝජන ගලනයන් 26%කින් අඩුවිය.

ඉදිරි 2022 වසර දෙස බැලීමේදී, 2021 වසරේ නැවත ඇතිවූ වර්ධනයත් සමග ගෝලීය සෘජු විදේශ ආයෝජන ප්‍රවණතාව හිතකර තත්වයක් පෙන්නුම් කෙරේ. යටිතල පහසුකම් අංශයේ ජාත්‍යන්තර ව්‍යාපෘති මූල්‍යයන අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරන අතර 2021 වසරේදී මෙන් නව සෘජු විදේශ ආයෝජන ප්‍රවණතාව, වෙනත් ගනුදෙනු හා සමාගම් තුළ මූල්‍ය ප්‍රවාහ සාපේක්ෂව නිෂ්ක්‍රීයව පවතී. කෙසේ වුවද, කලින් කලට වසංගතයේ ඇතිවූ වෙනස්වීම්, එන්නත්කරණයේ අවධි, කම්කරු හා සැපයුම් දාම අවහිරතා, බලශක්ති මිල ගණන් සහ උද්ධමනීය පීඩනය වැනි පෙර අත්නොවිඳි අවදානම් හා අවිනිශ්චිත තත්වයන් ද මෙහිදී ඇතිවිය.

# 2021 වසරේ විශේෂ අවස්ථා




**ඇ.ඩො. බිලියන 2.56** වටිනාකමකින් යුත් ආයෝජන සඳහා ව්‍යාපෘති අනුමැතින් **126** ලබා දෙනු ලැබීය.
(නව ව්‍යාපෘති 36ක් සහ ව්‍යාපෘති පුළුල් කිරීම් 90)



මංතීරු හතරකින් යුත් පොළව මට්ටමට ඉහලින් දිවෙන මහාමාර්ගයක් ඉදිකිරීම හා මෙහෙයුම් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා **ඇ.ඩො. මිලියන 821** අනුමත කරන ලදී.

බටහිර කොළඹ බහාළුම් පර්යන්තය වැඩිදියුණු කිරීම හා මෙහෙයුම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා **ඇ.ඩො. මිලියන 651** ආයෝජන ගිවිසුම් අත්සන් කරනු ලැබීය.



වසර තුළ මෙරටට **ඇ.ඩො. මිලියන 780** සෘජු විදේශ ආයෝජන ගලනයක් හා **ඇ.ඩො. මිලියන 1,052** දේශීය ආයෝජනය ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට හැකිවිය.



**ඇ.ඩො. බිලියන 8.8** වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයන් (ජාතික වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 64% හා ජාතික කාර්මික අපනනයනයෙන් 83%)



ඖෂධ හා රෙදිපිළි නිෂ්පාදනය සඳහා විශේෂිත අපනයන සැකසුම් කලාප **2 (EPZs)** ආයෝජනය සඳහා සූදානම්ව පවතී

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පිළිබඳ සංක්ෂිප්ත සටහනක්

## 2021 වසරේදී සෘජු විදේශ ආයෝජන ගලනය (ඇ. ඩො. මිලියන)

| | |
|---|---|
| 1978 - 2011 | 7,189 |
| 2012 | 1,338 |
| 2013 | 1,391 |
| 2014 | 1,616 |
| 2015 | 970 |
| 2016 | 801 |
| 2017 | 1,710 |
| 2018 | 2,367 |
| 2019 | 1,189 |
| 2020 | 687 |
| 2021 | 780 |

1978 - 2021 දක්වා කාලසීමාවේදී රට තුළට සමස්ත සෘජු විදේශ ආයෝජන ගලනය ඇ.ඩො. බිලියන 20කි.

## 2021 වසරේ ආර්ථික බලපෑම



**64%** ජාතික අපනයනයෙන්

**83%** ජාතික කාර්මික අපනයනයෙන්

**96%** ජාතික ඇඟළුම් හා රෙදිපිළි අපනයනයෙන්

**6%** සමස්ත ශ්‍රම බලකායෙන්

**15**
මෙහෙයුම් කටයුතුවල නිරත අපනයන සැකසුම් කලාප

**2**
විශේෂයෙන් ඖෂධ හා රෙදිපිළි නිෂ්පාදනය සඳහා අළුතින් ඉදිකෙරෙන අපනයන සැකසුම් කලාප (ආයෝජනය සඳහා සූදානම් )

**> 1,600**
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ මෙහෙයුම් සිදුකරන සමාගම්

**> 500,000**
සමුච්චිත සෘජු රැකියා උත්පාදනය

**ඇ.ඩො. බිලියන 20**
1978 - 2020 දක්වා වන කාලසීමාවේදී රටතුලට සෘජු විදේශ ආයෝජන ගලනය

**ඇ.ඩො. බිලියන 8.8**
වාර්ෂික වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයන්

මූලාශ්‍රයඃ ආයෝජන මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව

## සෘජු විදේශ ආයෝජන (FDI) ආංශික දායකත්වය

## මෙරට සෘජු විදේශ ආයෝජන සිදුකරන ප්‍රමුඛ රටවල් 10

2012 – 2021 කාලය තුළ ඇ.ඩො. බිලියන 12.8 සෘජු විදේශ ආයෝජන ගලනය




2012 - 2021




2012 - 2021

## අපනයන සැකසුම් කලාප (EPZs)




මෙහෙයුම්හි නිරත **අ.සැ.ක 15**

මෙහෙයුම් සිදුකරන සමාගම් **> 265**

රැකියා උත්පාදනය **>130,000**

වාර්ෂික අපනයන ආදායම **ඇ.ඩො. බිලියන 3**

**සංවර්ධනය කරමින් පවතින (ආයෝජනය සඳහා සූදානම්) අ.සැ.ක 2**
විශේෂයෙන්ම ඖෂධ හා රෙදිපිළි නිෂ්පාදනය සඳහා (හම්බන්තොට හා එරාවූර් අ.සැ.ක)

# 2021 වසරේ ශ්‍රී ලංකාවේ ආයෝජන කාර්ය සාධනය

## 2021 වසරේ ව්‍යාපෘති කාර්ය සාධනය

ඇස්තමේන්තුගත ආයෝජනය (ඇ.ඩො. මිලියන)

| | ආකාරය | ව්‍යාපෘති සංඛ්‍යාව | විදේශීය | දේශීය | එකතුව |
|---|---|---|---|---|---|
| **අනුමත ව්‍යාපෘති** | නව | 36 | 1,601 | 415 | 2,568 |
| | පුළුල් කිරීම් | 90 | 140 | 412 | |
| **ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති** | නව | 21 | 98 | 100 | 595 |
| | පුළුල් කිරීම් | 93 | 115 | 282 | |
| **ක්‍රියාත්මක ව්‍යාපෘති** | නව | 16 | 25 | 87 | 430 |
| | පුළුල් කිරීම් | 37 | 104 | 214 | |
| **වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘති** | නව | 22 | 43 | 103 | 385 |
| | පුළුල් කිරීම් | 29 | 85 | 154 | |

සටහන: 2022 මාර්තු මස වනවිට අවලංගු ව්‍යාපෘති හැර

## 2021 වසරේ අනුමත ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| අනුමත | ගිවිසුම් අත්සන් කරන ලද | ක්‍රියාත්මක කරන ලද |
|---|---|---|
| **ඇ.ඩො. මිලියන 2,568 (නව ව්‍යාපෘති 36 ව්‍යාපෘති පුළුල් කිරීම් 90)** | **ඇ.ඩො. මිලියන 1,230 (නව ව්‍යාපෘති 23 ව්‍යාපෘති පුළුල් කිරීම් 56)** | **ඇ.ඩො. මිලියන 291 (නව ව්‍යාපෘති 9 ව්‍යාපෘති පුළුල් කිරීම් 15)** |

සටහන: 2022 මාර්තු වන විට ප්‍රගතිය

## 2021 වසරේදී සෘජු විදේශ ආයෝජන ගලනය

2021 වසරේ සෘජු විදේශ ආයෝජන ගලනය ඇ.ඩො. මිලියන 780 ලෙස වාර්තා විය. 2021 වසරේදී ශ්‍රී ලංකාවට ලැබුණු මුළු සෘජු විදේශ ආයෝජනයෙන් වැඩිම සෘජු විදේශ ආයෝජනය නිෂ්පාදන හා දුරකථන සන්නිවේදන යන අංශ දෙක (29%බැගින්) සඳහා ලැබී ඇති අතර, පිළිවෙලින් දේපළ සංවර්ධන අංශය සඳහා (18%), හෝටල් අංශය සඳහා (9%), තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි බැහැරින් ඉටුකර ගැනීම සඳහා (6%) ආදී වශයෙන් ලැබී ඇත.

### සෘජු විදේශ ආයෝජනයන්හි ආංශික දායකත්වය (ඇ.ඩො. මිලියන)




### සෘජු විදේශ ආයෝජන කරන ලද ප්‍රමුඛ රටවල් 10



## ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අපනයනය

2021 වසරේ ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ මුළු අපනයන ඇ.ඩො. මිලියන 8,788 ලෙස වාර්තා වූ අතර එය ජාතික අපනයනයෙන් 64% සහ ජාතික කාර්මික අපනයනයෙන් 83% නියෝජනය කෙරේ. ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ මුළු අපනයනයෙන් 60% ඇඟළුම් හා රෙදිපිළි අංශයෙන්ද, 13% රබර් අංශයෙන්ද, 5% ආහාර හා පාන වර්ග අංශයෙන් හා 3% ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපකරණ අංශයෙන්ද සමන්විතය. ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ සමස්ත අපනයන සඳහා සේවා අංශයේ දායකත්වය 8% විය.




## 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ වෙළඳ භාණ්ඩ අපනයනය (ඇ.ඩො. මිලියන)



# 2021 වසරේ කැපී පෙනෙන ආයෝජන

## යටිතල පහසුකම්



- ආයෝජන මණ්ඩලය විසින් මංතීරු හතරකින් යුත් පොළව මට්ටමට ඉහලින් දිවෙන මහාමාර්ගය ඉදිකිරීම සඳහා චීනයෙන් ඇ.ඩො. මිලියන 821ක ආයෝජනයක් අනුමත කරනු ලැබීය.
- ආයෝජන මණ්ඩලය විසින් කොළඹ වරාය බටහිර පර්යන්තය සංවර්ධනය හා මෙහෙයුම් කිරීම සඳහා ඉන්දියාවේ අදානි සමාගම සමග ඇ.ඩො. මිලියන 651ක වටිනාකමකින් යුත් ආයෝජනයක් අනුමත කරනු ලැබීය.
- ආයෝජන මණ්ඩලය විසින් කොළඹ 04 ප්‍රදේශයේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා රක්නා ආරක්ෂා ලංකා සමාගම සමග ඇ.ඩො. මිලියන 27.5ක වටිනාකමකින් යුත් ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. මේ වනවිට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

## රබර්



- රබර් මෙට්ට නිෂ්පාදනය කිරීම සඳහා වන ව්‍යාපෘතියක් සඳහා ආයෝජන මණ්ඩලය විසින් ඇ.එ.ජ ආයෝජකයෙකු සඳහා අනුමැතිය ලබාදුන් අතර ඇ.ඩො. මිලියන 20ක වටිනාකමකින් යුත් ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.
- ඝන හා වායුමය ටයර් නිෂ්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ආයෝජන මණ්ඩලය විසින් ග්ලෝබල් රබර් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සඳහා අනුමැතිය ලබාදුන් අතර ඇ.ඩො. මිලියන 20ක වටිනාකමකින් යුත් ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

## වෙනත් නිෂ්පාදන



- බෝට්ටු/කුඩා යාත්‍රා නිෂ්පාදනය/එකලස් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ආයෝජන මණ්ඩලය විසින් මාලදිවයිනේ ආයෝජකයෙකු සඳහා අනුමැතිය ලබාදුන් අතර ඇ.ඩො. මිලියන 58ක වටිනාකමකින් යුත් ගිවිසුමක් අත්සන් කරනු ලැබීය.

## ඇඟළුම් හා රෙදිපිළි



- එරාවූර් රෙදිපිළි නිෂ්පාදන කලාපයේ පිහිටුවීමට නියමිත පිළිවෙලින් ඇ.ඩො. මිලියන 35ක හා ඇ.ඩො. මිලියන 30ක වටිනාකමකින් යුත් රෙදිපිළි නිෂ්පාදනාගාර දෙකක් ඉදිකිරීම සඳහා වන ඉන්දීය හා ඇ.එ.ජනපද ආයෝජන දෙකක් සඳහා ආයෝජන මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙනු ලැබීය.
- 2021 වසරේ දී ඔමේගා ලයින් ලිමිටඩ් හා හේලීස් ෆැබ්රික් (පීඑල්සී) පිළිවෙලින් ඇ.ඩො. මිලියන 24ක හා ඇ.ඩො. මිලියන 23ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති පුළුල් කිරීම් සිදුකර ඇත.

## සංචාරක හා විවේක




- ආයෝජන මණ්ඩලය විසින් කාමර 184කින් සමන්විත කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ හෝටලය ඉදිකිරීම සඳහා ජපානය සමග ඇ.ඩො. මිලියන 27ක වටිනාකමකින් යුත් හවුල් ව්‍යාපාරයක් සඳහා ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. මේ වනවිට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.
- ආයෝජන මණ්ඩලය විසින් මෙල්වා හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සමග ඇ.ඩො. මිලියන 52 වටිනාකමකින් යුත් ව්‍යාපෘති පුළුල් කිරීමේ ගිවිසුමක් අත්සන් කරන ලදී.

## විදුලි සංදේශ



- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ආයෝජන මණ්ඩලය සමග ඇ.ඩො. මිලියන 155ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති පුළුල් කිරීමේ ගිවිසුමක් අත්සන් කරන ලදී.

# මෑතකාලීන ආරම්භයන්

2020 වසරේ මාර්තු මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් තාත්වික කාල රාමුවක් තුළ ක්‍රියාත්මක කළ හැකි හා පැහැදිලිව නිර්වචනය කර ඇති ආයෝජන ආකර්ෂණ ප්‍රමුඛතාවන් සහිත විස්තීර්ණ උපාය මාර්ගයක් වැඩිදියුණු කරනු ලැබීය. රටේ නිසඟ හා තරගකාරී වාසි පිළිබඳ ගැඹුරු අධ්‍යයනයන් මෙන්ම කලාපීය තරගකරුවන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් පදනම් කරගෙන සකස් කරන ලද මෙම නව උපායමාර්ග මගින් රටේ ආර්ථික පසුබිම වෙනස් කිරීම සහ සහෝපකාරී ආයෝජන වාතාවරණයක් ඇති කිරීම අරමුණු කෙරේ. "රටේ ආකර්ෂණීයබව" සහ "ආයෝජන මණ්ඩලය නවීකරණය" යන මූලික අරමුණු දෙක ඉලක්ක කර සකස්කර ඇති මෙම උපාය මාර්ග සංරචක 7ක ප්‍රවේශයක් හරහා විස්තර කර ඇති අතර එමගින් ඉලක්කගත සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම හා ආර්ථික වර්ධනය ඇතිකිරීම යන ව්‍යුහාත්මක ප්‍රවේශයන් සහිත ප්‍රමුඛ ක්ෂේත්‍රයන් ඉලක්කකර ඇත.

**ප්‍රමුඛතාවය සහිත පුළුල් ක්ෂේත්‍ර හය වන්නේ:**



| නිෂ්පාදන | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) | සත්කාරක සේවා හා සංචාරක කර්මාන්තය | කෘෂිකර්මාන්තය හා ආහාර පිරිසැකසුම් කිරීම | වෙනත් සේවාවන් | ඉදිකිරීම්, යටිතල පහසුකම් හා සැපයුම් සේවා |
|---|---|---|---|---|---|
| - ඖෂධ<br>- ඉහළ අගයක් එක්කළ ඇඟළුම්<br>- ඉලෙක්ට්‍රොනික් හා විද්‍යුත් භාණ්ඩ | - මෘදුකාංග වැඩිදියුණු කිරීම<br>- ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය/දැනුම ක්‍රියාවලි කළමනාකරණය (BPM/KPM),<br>- තොරතුරු තාක්ෂණ පුහුණු, අධ්‍යාපන සහ නැගීඑන තාක්ෂණයන් | - කෘෂි /පාරිසරික සංචාරක කර්මාන්තය<br>- ත්‍රාසජනක සංචාරක කර්මාන්තය<br>- සුඛෝපභෝගී හෝටල්<br>- MICE සංචාරක කර්මාන්තය (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන) | - රබර්<br>- කෘෂිකාර්මික/ කෘෂි පිරිසැකසුම් කරන ලද ආහාර<br>- මත්ස්‍ය නිෂ්පාදනය | - කලාපීය මුලස්ථාන<br>- වෙළඳාම<br>- සමුද්‍රීය<br>- විශ්ව විද්‍යාල | - වේගයෙන් සංවර්ධනය වන වරාය, හා ගුවන් තොටුපළ |

තොරතුරු සන්නිවේදන තාක්ෂණය, සත්කාරක සේවා හා සංචාරක කර්මාන්තය සම්ප්‍රදායික කර්මාන්තයන්ගෙන් වෙනස්වූ ("Game-changers") ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන ඇති අතර කෘෂිකර්මාන්තය හා කෘෂි පිරිසැකසුම් කරන ලද ආහාර අංශය නව සැලසුමෙහි වේගවත් හා පුළුල් වර්ධනයක් සඳහා මග සලසන මූලික ක්ෂේත්‍ර වේ. හඳුනාගත් වැඩි ප්‍රවණතාවයක් ඇති වෙනත් අංශ වන්නේ;

- ඖෂධ අංශය : සියලු වර්ගයේ ඖෂධ නිෂ්පාදනය සඳහා අක්කර 400ක කලාපයක් උදා: ජෛවඖෂධ, එන්නත්, ක්‍රියාකාරී ඖෂධීය සංඝටක අඩංගු ද්‍රව්‍ය (APIs), ස්වභාවික පෝෂණ නිස්සාරක (Nutraceuticals) ආදිය.
- ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපකරණ අංශය : මිනිරන් හා ග්‍රැෆීන් ආශ්‍රිත නිෂ්පාදන, සංවේදක හා ස්විච, අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක (IOT) උපකරණ, මුද්‍රිත පරිපථ පුවරු (PCBs), විද්‍යුත් පැනල් පුවරු හා ජංගම දුරකතන ආදිය වැනි අනාගත තාක්ෂණයන්හි වාසි ලබා ගැනීම.
- වර්ධනය වන පාරිභෝගික ආර්ථිකයට මෙන්ම පුළුල්වන නිෂ්පාදන හා සේවා අංශ සඳහා සහය වීමට යටිතල පහසුකම් සහ කාර්ය සම්පාදන, කලාපීය මූලස්ථාන (HQs), මූල්‍ය සේවා, වෙළඳාම, සමුද්‍රීය හා විශ්වවිද්‍යාල ආදී සේවාවන් අවශ්‍ය වේ.

# 2021 වසර තුළ සිදුකරන ලද මූලික ප්‍රතිපත්තිමය ආරම්භයන්

1. හම්බන්තොට ආරබොක්ක ප්‍රදේශයේ ඖෂධ නිෂ්පාදන කලාපය ස්ථාපනය කිරීම

උසස් තත්වයේ ඖෂධ දේශීයව සැපයීම මගින් ශ්‍රී ලංකාවට සුවිශාල ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ ගෙන දිය හැකි මෙන්ම අපනයන මගින් විදේශ විනිමය ඉපයීමේ ප්‍රවණතාවක් ඇති කර්මාන්තයක් ලෙස ඖෂධ කර්මාන්තය හඳුනාගනු ලදුව, ලොව ප්‍රමුඛ ආයෝජකයින් ආකර්ෂණය කරගැනීම සඳහා උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස අතිනවීන ඖෂධ නිෂ්පාදන කලාපය ආරම්භකර තිබේ.

යෝජිත ඖෂධ නිෂ්පාදන කලාපය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරබොක්ක ප්‍රදේශයේ ස්ථාපනය කර ඇති අතර වරකට අක්කර 200 ලෙස අදියර දෙකකදී අක්කර 400 ප්‍රදේශයක් තුල සංවර්ධනය කෙරේ. පළමු අදියරේදී ඖෂධ සමාගම් 20 ස්ථාපනය කිරීම සඳහා අක්කර 200ක ප්‍රදේශයක් සංවර්ධන කරනු ලබන අතර දෙවන අදියරේදී ඉතිරි අක්කර 200ක ප්‍රදේශයේ ඖෂධ සමාගම් 20 ඉදිකරනු ඇත.

යෝජිත ඖෂධ කලාපය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය මේ වනවිට සම්පූර්ණකර ඇති අතර, ඒ සඳහා 2021 අගෝස්තු 19 වන දින පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (SDP Act) යටතේ කලාපය තුළ ස්ථාපනය කරනු ලබන ඖෂධ සමාගම් සඳහා අදාලවන යෝජිත ආයෝජන දිරිගැන්වීම් මෙලෙස ගැසට් පත්‍රයේ පළකර ඇත.

- සමාගම් ආදායම් බද්දෙන් (Corporate Income Tax (CIT)) නිදහස් කිරීම

  අ. අපනයන හරහා උත්පාදනය වන ආදායම සඳහා (අපනයන සේ සැලකෙන භාණ්ඩ ඇතුළුව)

  පූර්ව නිර්වචනය කරන ලද නිර්ණායක පදනම් කරගෙන අවමය වසර 5ක සිට උපරිමය වසර 10ක කාලයක් දක්වා බදු විරාම ලබාදෙනු ඇත.

  එකී බදු විරාම කාලසීමාව අවසන් වීමෙන් පසුව ව්‍යවසාය විසින් උත්පාදනය කරනු ලබන ලාභය සම්බන්ධයෙන් අපනයනකරුවන් සඳහා එම අවස්ථාවේ බලපැවැත්වෙන සමාගම් ආදායම් බදු අනුපාතය අදාලවනු ඇත.

  ආ. දේශීය වෙළඳපොළට අලෙවි කිරීම මගින් ආනයන ආදේශක හරහා ආදායම උත්පාදනය කිරීම සඳහා

  එම කාලයේදී අපනයනකරුවන් සඳහා අදාලවන පවතින සහනදායි සමාගම් ආදායම් බදු අනුපාතය පූර්ව නිර්වචනය කරන ලද නිර්ණායක පදනම් කරගෙන අවම වශයෙන් වසර 5 සිට උපරිම වසර 10ක කාලයක් දක්වා ලබාදිය යුතුය.

  ඉහත සඳහන් සහනදායි කාලසීමාව අවසන් වීමෙන් පසු, එම කාලයේදී නිෂ්පාදකයින් සඳහා එම අවස්ථාවේ බලපැවැත්වෙන සමාගම් ආදායම් බදු අනුපාතය ව්‍යවසායන් විසින් උත්පාදනය කරනු ලබන ලාභය සම්බන්ධයෙන් අදාල විය යුතුවේ.

- ආනයන බදු හා තීරු බදු වලින් නිදහස් කිරීම

  අ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව තුළ ඉදිකිරීම් හා ඊට අදාල අයිතම ආනයනය

  - සියලු බදු හා තීරුබදු වලින් නිදහස් කෙරේ (රේගු බදු, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු, සෙස් බදු හා එකතුකළ අගය මත බදු).

  ආ. ප්‍රාග්ධන අයිතම ආනයනය (පිරියත, යන්ත්‍ර, උපකරණ)

  - සියලු බදු හා තීරුබදු වලින් නිදහස් කෙරේ (රේගු බදු, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු, සෙස් බදු හා එකතුකළ අගය මත බදු).

  ඇ. අමු ද්‍රව්‍ය හා නිෂ්පාදන/ක්‍රියාවලි හා අදාල පාරිභෝගික ද්‍රව්‍ය ආනයනය (අපනයන සේ සැලකෙන භාණ්ඩ ඇතුළුව අපනයනය සඳහා නිෂ්පාදන සහ දේශීය වෙළඳපොළට අලෙවි කිරීම මගින් ආනයන ආදේශක යන දෙවර්ගයම සඳහා)

  - සියලු බදු හා තීරුබදු වලින් නිදහස් කෙරේ (රේගු බදු, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු, සෙස් බදු හා එකතුකළ අගය මත බදු).

- ප්‍රවාසිකයින්ගේ ආදායම් බද්දෙන් නිදහස් කිරීම

## 2. එරාවූර් රෙදිපිළි නිෂ්පාදන කලාපය ස්ථාපනය කිරීම

එරාවූර්හි අක්කර 200 වපසරියකින් යුත් භූමියක ඉදිකිරීමට යෝජිත කාර්මික කලාපය දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල යන දෙකටම රෙදිපිළි සැපයීම සඳහා රෙදිපිළි නිෂ්පාදන උද්‍යානයක් ලෙස ස්ථාපනය කර තිබේ. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන මෙම කලාපය මගින් රෙදිපිළි ආනයනය සඳහා වැයවන විදේශ විනිමය අඩුවීම සහ අමුද්‍රව්‍ය බෙදාහැරීමේ වේගය වැඩිවීමක් සමග සංසන්දනාත්මක අඩු පිරිවැයකට නියමිත වේලාවට අමුද්‍රව්‍ය සැපයීම මගින් රටට මෙන්ම ඇඟළුම් කර්මාන්තයට සුවිශාල ඉඩ ප්‍රස්ථාවක් අත්කර දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙමගින් ප්‍රභවස්ථාන පිළිබඳ නිර්නායක (නිෂ්පාදිත රට පිළිබඳ නිර්නායක) සපුරාලීම මගින් ඇඟළුම් නිෂ්පාදකයන්ට ද්විපාර්ශ්වික හා ඒකපාර්ශ්වික ගිවිසුම් (EU GSP+, ISFTA, SLPFTA) මගින් සලසා ඇති සහන සඳහා සුදුසුකම් ලැබීමේ මග සැලසේ.

2021 වසරේදී මෙම එරාවූර් කාර්මික කලාපයේ ඉදිකිරීම් කාර්යයන් කඩිනම් කිරීමට සහ මෙහෙයුම් ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර මේ වනවිට එක් ආයෝජකයෙකු විසින් ඇ.ඩො. මිලියන 35 ආයෝජනයක් සිදුකර ඇති අතර තවත් ආයෝජකයින් කිහිප දෙනෙකුම එහි රෙදිපිළි කර්මාන්තශාලා ඉදිකිරීමට කැමැත්ත පළකර ඇත. තවද, එරාවූර් කලාපයේ අමතර අක්කර 65 ප්‍රමාණයක් 2025 වසරේ සිට ව්‍යාපෘති සඳහා ලබාගත හැකිවේ.

මෙම රෙදිපිළි නිෂ්පාදන කලාපය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත්කළ යුතුව ඇති අතර මේ වනවිට ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ 3.2 හා 3.4 යන ගැසට් නිවේදන ප්‍රකාශයට පත්කර ඇති අතර ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය අපේක්ෂා කෙරේ.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ කලාපය තුළ ස්ථාපනය කරනු ලබන රෙදිපිළි නිෂ්පාදන සමාගම් සඳහා අදාලවන යෝජිත ආයෝජන දිරිගැන්වීම් මෙලෙස ගැසට් පත්‍රයේ පළකර ඇත.

- **ආයතනික ආදායම් බද්දෙන් නිදහස් කිරීම** (Corporate Income Tax - CIT)

  ආයෝජන හා රැකියා ප්‍රමාණය පදනම් කරගෙන, අවමය වසර 5ක සිට උපරිම වසර 10ක කාලයක් දක්වා බදු විරාම ලබාදෙනු ඇත.

  එකී බදු විරාම කාලසීමාව අවසන් වීමෙන් පසුව, ඉහත රැකියා ප්‍රමාණය මත පදනම්ව වසර 2-5 කාලයක් සඳහා එම අවස්ථාවේ අපනයනකරුවන් සඳහා බලපැවැත්වෙන ආයතනික ආදායම් බදු අනුපාතයෙන් 50% අදාලවනු ඇත.

- **ආනයන බදු හා තීරු බදු වලින් නිදහස් කිරීම**

  **අ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව තුළ ඉදිකිරීම් හා අදාල අයිතම ආනයනය**
  - සියලු බදු හා තීරුබදු වලින් නිදහස් කෙරේ (රේගු බදු, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු, සෙස් බදු හා එකතුකළ අගය මත බදු).

  **ආ. ප්‍රාග්ධන අයිතම ආනයනය (පිරියත, යන්ත්‍ර, උපකරණ)**
  - සියලු බදු හා තීරුබදු වලින් නිදහස් කෙරේ (රේගු බදු, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු, සෙස් බදු හා එකතුකළ අගය මත බදු).

  **ඇ. අමුද්‍රව්‍ය හා නිෂ්පාදන/ක්‍රියාවලි හා අදාල පාරිභෝගික ද්‍රව්‍ය ආනයනය (අපනයන සේ සැලකෙන භාණ්ඩ ඇතුළුව අපනයනය සඳහා නිෂ්පාදන සහ දේශීය වෙළඳපොළට අලෙවි කිරීම මගින් ආනයන ආදේශක යන දෙවර්ගයම සඳහා)**
  - සියලු බදු හා තීරුබදු වලින් නිදහස් කෙරේ (රේගු බදු, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු, සෙස් බදු හා එකතුකළ අගය මත බදු).

- **ප්‍රවාසිකයින්ගේ ආදායම් බද්දෙන් නිදහස් කිරීම**

### 3. මහා පරිමාණ ටයර් නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති තත්වය ලබාගැනීම

හම්බන්තොට ජාත්‍යන්තර වරාය තුළ පිහිටි අක්කර 121 බිම් ප්‍රදේශයක ටයර් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා සිලෝන් ටයර් නිෂ්පාදන සමාගම (Ceylon Tyre Manufacturing Company) 2020 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුලත් වනු ලැබීය. වසර තුනකදී කර්මාන්ත ශාලාවේ මෙහෙයුම් ආරම්භ වන අතර එමගින් සෘජු රැකියා අවස්ථා 2,000 උත්පාදනය වනු ඇත. පළමු අදියරේදී අර්ධ වානේ රේඩියල් ටයර් හා ට්‍රක් රථ, බස් රථ හා මගී මෝටර් රථ සඳහා අවශ්‍ය සියලු වානේ රේඩියල් ටයර් නිෂ්පාදනය කිරීමට සහ ධාරිතාව අනුව ටයර් මිලියන 9 අපනයනය කිරීමට අපේක්ෂා කෙරේ. ඇ.ඩො. මිලියන 300 අපේක්ෂිත සෘජු විදේශ ආයෝජනයක් සහිත උසස් තත්වයේ ව්‍යාපෘතියක් වන මෙය "ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ" විධිවිධාන යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

### 4. ප්‍රමුඛ ජාත්‍යන්තර තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතියක් සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති තත්වය ලබාගැනීම

ප්‍රමුඛ ජාත්‍යන්තර තාක්ෂණ සමාගමක් වන HCL ටෙක්නොලොජීස් සමාගම විසින් ඇ.ඩො. මිලියන 10.25 අපේක්ෂිත ආයෝජනයක් සහිත මෘදුකාංග වැඩිදියුණු කිරීමේ හා අපනයන වෙළඳපල සඳහා තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවාවන් සැපයීමේ ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී ඇත. 2020 වසරේදී සිය මෙහෙයුම් ආරම්භ කරන ලද HCL සමාගම මූලිකවම ප්‍රධාන ස්ථාවර ආයතන සඳහා (Blue-chip Organizations) නවීනතම විසඳුම් ලබාදීමට අවධානය යොමුකරන අතර ජීව විද්‍යාව හා සෞඛ්‍යය, බැංකුකරණය, මූල්‍ය සේවා හා රක්ෂණ, විදුලි සංදේශ, සිල්ලර වෙළඳාම, පාරිභෝගික, ප්‍රකාශන, බලශක්ති හා උපයෝගිතා ඇතුලු විවිධ කාර්මික ක්ෂේත්‍රයන් ඔස්සේ සිය සේවාලාභීන් සඳහා සේවාවන් සැපයෙයි.

HCL සමාගම ඉදිරි වසර 3-5 දක්වා වන කාලය තුළ රැකියා අවස්ථා 3,500 පමණ උත්පාදනය කිරීමට සැලසුම් කරන අතර ආරම්භයේ දී ශ්‍රී ලාංකිකයින් 1,500කට රැකියා සැපයෙන අතර 2029 වසර වනවිට එම අගය 9,000 දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

HCL සමාගම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය ආරම්භකර ඇති අතර එම ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිවී ඇත.

### 5. ශ්‍රී ලංකා ආයෝජන සංසදය 2021

සෘජු විදේශ ආයෝජන අවස්ථා හා ශ්‍රී ලාංකීය ප්‍රාග්ධන වෙළඳපලෙහි ආයෝජන ගෝලීයව ප්‍රවර්ධනය කිරීම සඳහා 'Invest Sri Lanka – Asia's Next Growth Haven' යන තේමාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කොළඹ කොටස් වෙළඳපල (CSE) සහ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (CCC) ඒකාබද්ධව ශ්‍රී ලංකා ආයෝජන සංසදය 2021 සඳහා සත්කාරකත්වය දක්වන ලදී.

2021 ජූනි 7 සිට 9 දක්වා පැවැත්වූ මෙම මාර්ගගත වැඩසටහන මගින් සෘජු විදේශ ආයෝජන හරහා පෞද්ගලික සම කොටස් ස්ථාපනය හා ලයිස්තුගත සමාගම් වල ආයෝජනය කිරීම හරහා ශ්‍රී ලංකාවේ ආකර්ෂණීය ආයෝජන අවස්ථා පිළිබඳ දැක්මක් ලබාදෙනු ලැබීය. ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නායකයින්, රාජ්‍ය හා පෞද්ගලික සමාගම්හි ඉහල නායකත්වය, ජාත්‍යන්තර විශේෂඥයින්, ආයෝජන බැංකුකරුවන් සහ උපදේශන සමාගම් විසින් සිදුකරන ලද ඉදිරිපත් කිරීම් මෙම සංසදයට ඇතුලත් විය.

හවුල්කාරීත්ව හිමිකම් අවස්ථා 40 සමග ඇ.ඩො. බිලියන 5කට වැඩි මහා පරිමාණ සෘජු විදේශ ආයෝජන 40කට වැඩි ගණනක් මෙහිදි ප්‍රදර්ශනය කෙරිණ.

මෙම ආයෝජන සඳහා 4,500කට වැඩි පිරිසක් ආකර්ෂණය කරගනු ලැබූ අතර ඉන් 1,900කට වැඩි දෙනෙකුගේ ආයෝජන විස්තර හඳුනාගනු ලැබීය. විභව්‍ය ආයෝජකයින් හා ව්‍යාපෘති හිමිකරුවන් එකිනෙකා අතර 150කට වැඩි සම්බන්ධතාවන් ඇතිවිය.

### 6. අනෙකුත් අරම්භයන්

කෘෂි-පිරිසැකසුම්, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපාංග, වානේ හා බැර කර්මාන්ත මෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය සඳහා පිළිවෙලින් හම්බන්තොට, හේනේගම, සූරියවැව හා මිරිජ්ජවිල ප්‍රදේශයන්හි අපනයන සැකසුම් කලාප හතරක් ස්ථාපනය කිරීම කෙරෙහි තවදුරටත් අවධානය යොමුවී ඇත.

2022 වසර සඳහාවන අයවැය යෝජනා මගින් යෝජිත කලාපවල යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය මුදල් වෙන්කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත්කර ඇත.

# අපගේ කාර්ය මණ්ඩලය

## මානව ප්‍රාග්ධනය

ආයතනය සාර්ථකත්වය කරා මෙහෙයවන කේන්ද්‍රීය බලවේගය අප කාර්ය මණ්ඩලය ලෙස සලකන්නෙමු. රාජ්‍ය සේවය පිළිබඳ දැඩි හැගීමක් ඇති සේවකයින්ගෙන් සැදුම් ලත් අප කාර්ය මණ්ඩලය දශක හතරකට වැඩි කාලයක කැපවීම හා වගකීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අද දින පවතින ශක්තිමත් ආයතනය ලෙස නැගීසිටීමට හැකිවීමේ පදනම වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විවිධ වූ සේවකයින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමකින් සමන්විත වේ. 1978 වසරේ ආයතනය ආරම්භයේ සිට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විවිධ පසුබිම්වලින් පැමිණෙන සාමාජිකයින් සඳහා වැඩිවන අවස්ථාවන් සළසා දී ඇත.

ආයෝජන ප්‍රවර්ධනය, නියාමනය හා සහය සේවා සැපයුම ප්‍රධාන මෙහෙයුම් වන ආයෝජන මණ්ඩලය, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියාවන් බලාපොරොත්තු වන සේවකයින් සඳහා අභිමත ආයතනය ලෙස අඛණ්ඩව පැවතේ.

## කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමේ ආයෝජන මණ්ඩල ප්‍රවේශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ශක්තිමත් ජනතාවාදී ක්‍රියාවන් අනුගමනය කරයි. රැකියා ප්‍රවර්ධනය, සේවක සහය හා වෘත්තීය සංවර්ධනය සැලකීමේදී සියලු සේවකයින්ට සාධාරණ මෙන්ම සමාන අවස්ථාවන් ලැබෙන බව අපි තහවුරු කරන්නෙමු.

අප අනුගමනය කරන කළමනාකරණ ක්‍රියාමාර්ග මගින් ආයතනයේ රැකියාව කරන කාලය පුරාවටම සේවකයින් සඳහා අඛණ්ඩ සහයක් තහවුරු කෙරේ. කාර්ය මණ්ඩල කළමනාකරණ කාර්යයන් හා අදාල ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන අතර හොඳින් අධීක්ෂණය කෙරේ.

ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩල කළමනාකරණ කාර්යයන්, බඳවාගැනීම හා මානව සම්පත් සංවර්ධනය සඳහා තෝරා ගැනීම, සුභසාධනය හා විනය ක්‍රියාමාර්ග දක්වා පරාසයක විහිදේ. කාර්ය මණ්ඩල කළමනාකරණය සිදුකිරීමේදී සමානාත්මතාව, අපක්ෂපාතිත්වය හා ආචාර ධර්ම වලට අනුව කටයුතු කිරීමට අපි අවධාරණය කරන්නෙමු. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය රජයේ නීති රීති හා ප්‍රතිපත්තිමය තීරණයන් අනුව පාලනය වේ. මෙකී රාමුවන් තුළ සේවකයින්ගේ ඵලදායීතාවය මෙන්ම රැකියා තෘප්තිය ඇතිකිරීම සඳහා කාර්ය මණඩල කළමනාකරණ ක්‍රියාමාර්ග සිදුකරන බවට ආයෝජන මණ්ඩලය සහතික වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ජාතික ආර්ථිකයේ වැදගත් කාර්යයක් ඉටු කෙරේ. දළ දේශීය නිෂ්පාදිතය සඳහා දායකවන ප්‍රමුඛ ජාතික ආයතන කීපය අතරින් එකක් වශයෙන් අප කාර්යමණ්ඩලය ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ ආර්ථික හා සමාජීය සුභසාධනය පිළිබඳව සිය වගකීම මනාව වටහාගෙන ඇත.

සියලු කාර්ය මණ්ඩල කළමනාකරණ කාර්යයන් සේවකයින්ගේ ජාතික වගකීම ඉටුකිරීමෙහිලා ඔවුන්ට සහයවීම අරමුණු කෙරේ. මෙම සියලු කාර්යයන් අනුකූලතාවය හා විශ්වාසනීයත්වය සලකා රාජ්‍ය ආයතන ආරක්ෂා කිරීමට හඳුන්වාදී ඇති ප්‍රතිපත්ති මගින් පාලනය වේ.

බඳවා ගැනීම හා තෝරාගැනීම සිදුකිරීමේදී විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලියක් හරහා සුදුසු දක්ෂතා සහිත පුද්ගලයින් ආකර්ෂණය කරගනු ලබන බව සහතික කෙරේ. මානව සම්පත් සංවර්ධන හා සුභසාධක ක්‍රියාමාර්ග මගින් සේවකයින්ට අර්ථසාධක, පුද්ගල හා වෘත්තීය සංවර්ධනය සඳහා ප්‍රමාණවත් සහයක් ලැබෙන බවට සහතික කෙරේ.

මෙම සියලු සහය සේවා සමගින් වගකීමෙන් හා විනයානුකූලව කටයුතු කිරීම සඳහා අපගේ සේවකයින් නිරන්තර දිරිමත් කෙරේ. ඇතිවිය හැකි යම් බිඳවැටීමක් මැඩලීම සඳහා විෂමාචාරයක් වේ නම් ඊට ඉක්මන් පිළියම් යෙදෙන බව සහතික වන ශක්තිමත් විනය ප්‍රතිපත්ති අප සතුවේ.

## මානව සම්පත් ප්‍රතිපත්ති

ආයෝජන මණ්ඩලයේ සියලු මානව කළමනාකරණ ක්‍රියාමාර්ග විස්තීර්ණ ප්‍රතිපත්ති තුනක් මගින් පාලනය වේ. මෙම ප්‍රතිපත්ති මගින් එක් එක් මානව සම්පත් කාර්යයන් යටතේ මණ්ඩලය අනුගමනය කළයුතු යහ පැවතුම් පිළිබඳව නිර්දේශ ලබාදේ.

### ◈ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත

මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත මගින් බඳවා ගැනීම්, පරිවාසය හා සේවය ස්ථිර කිරීම, පාරිතෝෂික, වැඩකරන පැය ගණන, පැමිණීම හා නිවාඩු, කාර්ය සාධනය ඇගයීම සහ පුහුණුව සහ සංවර්ධනය හා අදාල සියලු කාර්යයන් පාලනය කෙරේ.

තවද මෙමගින් උසස්වීම්, මාරුවීම්, සේවයෙන් පහළ දැමීම්, වැඩකිරීමේ කොන්දේසි, දුක්ගැනවිළි මෙන්ම සේවක සංගම් සම්බන්ධ කරුණු සම්බන්ධයෙන්ද මාර්ගෝපදේශ ලබාදේ. මෙම අත්පොතට අනුකූලවීම මගින් අවංකබව හා විශ්වාසනීයත්වය සහතික කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතිය යටතේ සාධාරණ අපගමනයක් සිදුවන අවස්ථා හැර අප නිරන්තරයෙන්ම මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොතට අනුකූලව කටයුතු කරන්නෙමු.

### ◈ බඳවා ගැනීමේ පටිපාටි ක්‍රමය

බඳවා ගැනීමේ කාර්යයන්ට අදාල සියලු කාර්යයන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සිදු කෙරේ. මෙම යෝජනා ක්‍රමය මගින් අභ්‍යන්තරව හා බාහිරව අවශ්‍ය නිපුණතා සහිත කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීමේදී අනුගමනය කළයුතු මාර්ගෝපදේශ සහ සලකා බැලිය යුතු නිර්ණායක පැහැදිලිව දක්වා ඇත.

### ◈ ආයතන සංග්‍රහය

ඉතා ඉහළ මට්ටමේ වෘත්තීයභාවයක් හා සේවා ආචාරධර්ම මනාලෙස පවත්වා ගැනීම කෙරෙහි අප විශ්වාසය තබා ඇත්තෙමු. ආයෝජන මණ්ඩලයේ ආයතන සංග්‍රහය එහි සියලුම සේවකයින් විසින් පිළිපැදිය යුතු පැවතුම් අචාරධර්ම පැහැදිලිව දක්වන ලද විධිමත් ලේඛණයකි. ආයතන සංග්‍රහයේ "විනය ක්‍රියාමාර්ග නීති" යටතේ විෂමාචාරයක යෙදීමේ හෝ නීතියට එරෙහිව ක්‍රියාකිරීමේ සිද්ධියකදී විධිමත් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දක්වේ.

## කාර්ය මණ්ඩලයේ සංයුතිය

ආයෝජන මණ්ඩල කණ්ඩායම, කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ සහ දිවයින පුරා පිහිටි අපනයන සැකසුම් කලාප/උද්‍යාන/ප්‍රාදේශීය කාර්යාලයන්ට අනුයුක්තව සේවය කරන අතර සමස්ත සේවක සංඛ්‍යාව 1,262කින් සමන්විතවේ.




ආයෝජන මණ්ඩලයේ ව්‍යුහය සේවක කාණ්ඩ තුනකින් සමන්විත වේ. සමස්ත කණ්ඩායමේ බහුතරය, එනම් 47% විධායක කාණ්ඩය නියෝජනය කරනු ලැබේ. කළමනාකරණ සහකාර නිලධාරීන්ගෙන් සහ ප්‍රාථමික මට්ටමේ ශ්‍රේණිය විධායක නොවන කාණ්ඩයට අයත්වේ. සමස්ත කාර්ය මණ්ඩලයෙන් 22% කලමනාකරණ සහකාර නිලධාරීන් වන අතර 31% ප්‍රාථමික මට්ටමේ ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය වේ.

අපගේ සේවකයින් අතර ස්ත්‍රී පුරුෂ තුලනය පවත්වා ගැනීමට අප නිරන්තර කටයුතු කරන්නෙමු. වර්ධනය හා සංවර්ධනය සඳහා සමාන අවස්ථාවන් සළසනු ලැබේ. අප කණ්ඩායමේ 34% කාන්තාවන් වන අතර 66% පිරිමි සේවකයින් විසින් නියෝජනය කරනු ලැබේ. කළමනාකරණ මට්ටමේ තනතුරුවල කාන්තා නියෝජනය සැළකූ විට අඛණ්ඩ ප්‍රගතියක් නිරීක්ෂණය වේ. අප කණ්ඩායම කණිෂ්ඨ කළමනාකාරිණියන් 136, මධ්‍යම මට්ටමේ කළමනාකාරිණියන් 123 සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණියන් 24 වශයෙන් කාන්තාවන්ගෙන් සමන්විතවේ. ආයෝජන මණ්ඩලයේ අංශ හා අපනයන සැකසුම් කලාප ප්‍රධානීන් ලෙස කටයුතු කරන ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් 36 දෙනාගෙන් 17% කාන්තාවන් වන අතර 83% වන බහුතරය පිරිමින් වේ. ආයෝජන මණ්ඩලය තුළ නායකත්ව තනතුරු සඳහා

කාන්තා නියෝජනය දිරිමත් කිරීමට අපේක්ෂා කරන අතර ඉදිරියට යන ආයතනයකට ස්ත්‍රී පුරුෂ විවිධත්වය වැදගත් වන බව අපි විශ්වාස කරන්නෙමු.

අප කණ්ඩායම විවිධ අධ්‍යාපනික හා වෘත්තිය පසුබිම් සහිත සේවකයින්ගෙන් සමන්විත වේ. මෙම විවිධ වූ දැනුම ආයෝජන මණ්ඩලයට අඛණ්ඩව සුවිශාල ප්‍රතිලාභ ගෙනදේ. අප කාර්යමණ්ඩලය 400කට වැඩි දෙනෙක් උපාධිධාරින් වන අතර 140කට වැඩි පශ්චාත් උපාධිධාරින්ගෙන් සමන්විත වේ. ඔවුන් ව්‍යාපාර පරිපාලනය, විද්‍යාව, කලා, ඉංජිනේරු, රාජ්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, සමාජ විද්‍යා, වැනි විවිධ අධ්‍යාපනික පසුබිම් සහිතවේ. තවද වෘත්තිමය ආයතනයන්හි සාමාජිකත්වය දරන 59 දෙනෙකුද ඊට අයත්ය.

විශේෂයෙන්ම සීඝ්‍රයෙන් වෙනස් වන, ඉතා තරඟකාරී අප ව්‍යාපාරයන්හිදී අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ඉතා වැදගත් බව අපි විශ්වාස කරන්නෙමු. සේවකයින්ට අඛණ්ඩව උසස් අධ්‍යාපනය හා වෘත්තිය සංවර්ධනයේ නියැලීම දිරිමත් කිරීම සඳහා ආයතනය විසින් ප්‍රතිපත්ති (දායකත්වය ලබාදීම, නිවාඩු ලබාදීම සහ උසස් වීම් ලබාදීම) හඳුන්වා දී ඇත.

## මානව සම්පතේ කාර්යභාරය

ගෝලීය වසංගතය මගින් රටට බලපෑම් එල්ලවී ඇති බැවින් අපගේ ඉදිරි ගමන වඩාත් අභියෝගාත්මක මෙන්ම ඒ සඳහා මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුව ඇත. රටේ ආර්ථික ස්ථායිතාව යලි ඇතිකිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ඉමහත් බලාපොරොත්තුවක් තබා ඇත.

අපගේ ජනතාවට හැකි උපරිම සහය ලබාදීමේ අභියෝගාත්මක කාර්යය ඉටුකිරීම මානව සම්පත වශයෙන් අපගේ වගකීම වේ. මෙම කාලසීමාව තුළ අප සම්පූර්ණයෙන්ම නව සාමාන්‍යකරණය අනුගතකර ගැනීමට උත්සාහ කරන අතර මානව සම්පත් කළමනාකරණය සේවකයින්ට උපරිම සේවයක් සැලසීම කාර්යය ඉටුකරන්නේ කෙසේද යන්න පිළිබඳව සොයා බැලේ. ධාරිතා වර්ධනය, තාක්ෂණික නවෝත්පාදන වැඩිදියුණු කිරීම හා සේවකයින්ට උපරිම අයුරින් සිය කාර්යයන් ඉටුකිරීමේ අවස්ථාවන් සළසාදීම කෙරෙහි අවධානය යොමුකර වඩාත් කාර්යක්ෂම හා නම්‍යශීලී ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදුකරනු ලබයි.

# ආයතනික සමාජ වගකීම

සන්නාමයේ ප්‍රතිරූපය වැඩිදියුණු කරමින් සමාජීය හා පාරිසරික ගැටලු පිළිබඳව මහජනයාගේ දැනුවත්භාවය ඇතිකරමින් මනා අචාර ධර්මයන්ට හා තිරසර සංවර්ධන ඉලක්කයන්ට සමාජීය වශයෙන් වගකිව යුතු අයුරින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ආකාරය ආයතනික සමාජ වගකීම් මගින් පෙන්නුම් කෙරේ.

ආයතනික සමාජ වගකීම් පිළිබඳ ක්‍රියාකාරකම්හි නියැලීම සඳහා සිය සමාගම් දිරිමත් කරන අතරම ආයෝජන මණ්ඩලය විසින් පරිසර සංරක්ෂණය විවිධාංගීකරණය හා කම්කරු ක්‍රියාපිළිවෙත් සහ ස්වේච්ඡා සේවයන්හි යෙදීම වැනි විවිධ ආයතනික සමාජ වගකීම්වල නිරතවේ.

## නිෂ්පාදනයන්හි නිරත ව්‍යවසායයන් මුහුණපාන ගැටළුවක් වන කම්කරු හිඟය අවම කිරීම සඳහා ගනු ලැබූ මූලික ක්‍රියාමාර්ග

ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ කම්කරු හිඟයට පිලියමක් වශයෙන් ආයෝජන මණ්ඩලය විසින් ආරම්භ කරන ලද කාර්යයන්;

### ◈ ආයෝජන මණ්ඩල රැකියා බැංකු වෙබ් අඩවිය

